නගරයක් තුළ ක්‍රියාත්මක කරන්න මහල් නිවාස ක්‍රමය හැර විකල්පයක් නැහැ



මිලින්ද මොරගොඩ

එක්සත් ජනතා නිදහස් සන්ධාන කොළඹ පුරපති අපේක්ෂක

එළඹෙන පළාත් පාලන මැතිවරණයේ කොළඹ මහනගර සභාවේ නගරාධිපති අපේක්ෂකයා ලෙස ඔබතුමා ඉදිරිපත්වන්නට තීරණය කළේ ඇයි?

මහනගර සභාවේ අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වන ලෙස මට මුලින්ම ආරාධනා කළේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමායි. පසුගිය මැතිවරණයෙන් පසුව නැවත දේශපාලනයට අවතීර්ණය වන්නට මට වුවමනාවක් තිබුණේ නැහැ. පසුගිය කාලයේ මම මගේ ව්‍යාපාර කටයුතුවල මෙන්ම සමාජ සේවා කටයුතුවල නිරත වෙමින් ජනාධිපතිතුමාගේ උපදේශකයකු ලෙසද කටයුතු කළා. ජනාධිපතිතුමා මට මුලින්ම ආරාධනා කරමින් කිවුවේ කොළඹ නගරයට අලුත් දර්ශනයක් ඉදිරිපත් කිරීමට එතුමාගේ අදහස් පවතින බවත් එය ක්‍රියාත්මක කිරීමට මට හැකියාවක් ඇති බවට එතුමා විශ්වාස කරන බවයි. පසුව මම අවස්ථා කිහිපයකදීම මේ පිළිබඳ ජනාධිපතිතුමා සමඟ දීර්ඝ වශයෙන් සාකච්ඡා කර එතුමාගේ දර්ශනය මම පිළිගත්තා. දීර්ඝ කාලයක් අපේ රටට පැවැති යුද්ධයෙන් පසුව කොළඹ නගරය 21 වැනි සියවස කරා ගෙන යායුතු බවයි ජනාධිපතිතුමාගේ අදහස. කොළඹ නගරය තුළ විවිධ ජාතීන් රාශියක් ජීවත්ව සිටිනවා. ඒ වගේම විවිධ ආගම් අදහන පුරවැසියන් සිටිනවා. ඒ වගේම විවිධ සමාජ කොටස් කොළඹ නගරය තුළ ජීවත් වෙනවා. නගරයක් හැටියට කොළඹ පොහොසත්ම නගරයක් නෙමෙයි. දුප්පත්කම සහ පොහොසත්කම අතර විශාල පරතරයක් පවතිනවා. ජනාධිපතිතුමාට අවශ්‍ය රටට මෙන්ම ජාත්‍යන්තරයේ ද අවධානය යොමුවන පරමාදර්ශී නගරයක් බවට කොළඹ නගරය පත් කිරීමයි කොළඹ නගරය අලංකරණය කිරීම පමණක් නෙමෙයි. නගරය තුළ ජනතාවට අවශ්‍ය සියලු පහසුකම් සැපයීමයි ජනාධිපතිතුමාගේ අරමුණ. එතුමාගේ දර්ශනයට සහ එතුමා තුළ පවතින උනන්දුවට ගරුකිරීමක් ලෙසයි මම කොළඹ නගරාධිපති අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වන්නට තීරණය කළේ. මම ජාතික දේශපාලනයේ අවුරුදු නවයක් පමණ කටයුතු කළා. මැති ඇමැති ධුරවල සිට එදිනෙදා ජනතාවට සෘජුව උදව් කිරීමට අපහසු බව එහිදී මට අවබෝධ වුණා. ඒ නිසා මම මෙය අවස්ථාවක් කර ගන්නා සෘජුවම ජනතාවට උදව් කිරීමට, මන්ත්‍රීවරයෙක් හැටියට කොළඹ නගරය තුළ පවතින ගැටලු පිළිබඳ මට අවබෝධයක් තිබුණා නමුත් පවතින මැතිවරණ ක්‍රමය අනුව එක පළාතකට පමණක් උදවු කිරීමට අපහසුයි. කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් ඒවිසාවේලේ සිට මොරටුවේ සිට උතුරු කොළඹ දක්වා කටයුතු කළ යුතුයි. ඒ නිසා මන්ත්‍රීවරයෙක් ලෙස රාජකාරී කටයුතු කිරීම අසීරු දෙයක්. මේ කරුණු සියල්ල පිළිබඳ අවධානය යොමු කිරීමෙන් පසුවයි මම නගරාධිපති අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වන්නට තීරණය කළේ.

ඔබතුමා ආණ්ඩු දෙකක වගකීමක් දරු අමාත්‍යාංශවල අමාත්‍ය ධුර දරු දේශපාලනඥයෙක්. ඔබගේ මේ තීරණය තුළ මිලින්ද මොරගොඩ කියන දේශපාලනඥයා ජාතික දේශපාලනයේ සිට නැවත පසුපසට ගියා කියා කවුරුන් හෝ පැවසුවහොත්?

අද ලෝකයේ දියුණු රටවල නගරාධිපතිවරුන් පවා එක්තරා මට්ටමක ජාතික චරිත බවට පත් වී තිබෙනවා. වර්තමානය වන විට බලය එක එක ආකාරයට විමධ්‍යගත වීමක් දක්නට ලැබෙනවා. ජනතාවට අවශ්‍ය සේවා ලබා ගැනීමටයි. තමන්ගේ අවශ්‍යතා ඉටුවන තුරු බලාසිටීමට ඔවුන්ට ඉවසීමක් නැහැ. ඇතැම් අවස්ථාවල පවතින ආණ්ඩුවකට වඩා නගර සභාවකට ලැබෙන ජනතා ඉල්ලීම් වැඩියි. මෙය ලෝකය තුළ පවතින හරයක්. ඒ නිසා බලය මේ මට්ටමට විමධ්‍යගත වීම ජනතා වුවමනාවක්. එය ආපසසට යාමක් හැටියට මම හිතන්නෙ නැහැ. එය නව යුගයක ආරම්භයක් යන්නයි මගේ මතය.

අතිගරු ජනාධිපතිතුමා පිළිබඳ පවතින පූර්ණ විශ්වාසය නිසා ඔබතුමා නැවතත් ශ්‍රේෂ්ඨාසනට පැමිණි බව සඳහන් කළා. ඔබතුමා අවසාන වශයෙන් අධිකරණ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා ලෙස කටයුතු කළ කාලසීමාව තුළ බොහෝ ධනාත්මක ස්ථාවරයන් කිහිපයක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළා අපට මතකයි. නමුත් අමාත්‍ය ධුරයක් දරමින් ඉටුකිරීමට නොහැකි වූ දේ ඉටුකිරීමට නගරාධිපති ධුරයක සිට හැකියාව ලැබෙයි කියා ඔබ විශ්වාස කරනවද?

අධිකරණ අමාත්‍යවරයා ලෙස මට දීර්ඝ කාලයක් කටයුතු කිරීමට ලැබුණෙ නැහැ. දීර්ඝ කාලයක් එම තනතුරේ කටයුතු කරන්නට ලැබුණ නම් විශාල වෙනසක් ඒ ක්ෂේත්‍රය තුළ සිදුකිරීමට මම සැලසුම් කර තිබුණා. ඊට අවශ්‍ය සහයෝගයත් මට ජනාධිපතිතුමාගෙන් ලැබුණා. නමුත් අපි මැතිවරණයක් අතරදීයි ඒ සියලු දේ සිදු කළේ. එවැනි වාතාවරණයක් තුළ ප්‍රතිපත්ති වෙනස්කම් සිදු කිරීමට අපහසුයි. නමුත් මේවර ඉතා පැහැදිලිව ජනාධිපතිතුමා මෙන්ම ආරක්ෂක ලේකම්තුමාත් කොළඹ නගරයේ විශාල සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ වගේම කොළඹ නගරය තුළ යහපත් වෙනසක් සිදු කිරීමට මම සූදානම් වී සිටිනවා.

කොළඹ නගරය මේ වාන විට සංවර්ධනය කරමින් පවතිනවා. නගරය අලංකරණය කර පිරිසිදුව විධිමත්ව පවත්වාගෙන යනවා අපට දකින්නට ලැබෙනවා. නමුත් ඔබ කියන විදිහට ජනාධිපතිතුමා සහ ආරක්ෂක ලේකම්තුමාත් මේ සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවනවා නම් කොළඹ සංවර්ධනයට මිලින්ද මොරගොඩ කියන චරිතය අවශ්‍ය වන්නේ ඇයි?

පසුගිය වසර කිහිපය තුළ කොළඹ නගර සභාව ක්‍රියාත්මක වුණේ නගරාධිපතිවරයකු නොමැතිවයි. ප්‍රජාතන්ත්‍රවාදය නමැති ව්‍යුහයේ බීම මට්ටම නගර සභාව ලෙස හඳුන්වන්න පුළුවන්. ඒ සැලැස්ම සඳහා ජනතාව එකඟත්ව කිරීමේ ව්‍යුහය වන්නේ නගර සභාවයි. නමුත් ජනතාවගේ හඳගැස්ම අවබෝධ කර නොගෙන නගර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කරනවා කියා කවුරුන් හෝ චෝදනා කරනවා නම් එයට හේතුව කොළඹ නගර සභාව අවුරුදු හතරක් නගරාධිපතිවරයකු නොමැතිව වෙනස් ආකාරයට පාලනය වීමයි. නමුත් ජනාධිපතිතුමා සහ ආරක්ෂක ලේකම්තුමාත් බලාපොරොත්තු වන්නේ නගර සභාව එක කණ්ඩායමක් බවට පත් කර ඒ පිළිබඳ ජනතා මතයක් ඇති කර එක මඟක ගමන් කරවීමටයි. නමුත් මේ අතර හිඩැසක් පවතින්නේ අවුරුදු හතරක කාලයක් එය ක්‍රියාත්මක නොවූ නිසයි.

කොළඹ නගරයේ ජීවත්වන පැල්පත් වාසී ජනතාව එම ප්‍රදේශවලින් ඉවත් කිරීමට යන බවට මේ වන විට කනාබහක් පවතිනවා. නමුත් රජයේ පාර්ශ්වය සඳහන් කරන්නේ ඔවුන් කොළඹ නගරයෙන් ඉවත් කරන්නේ නැතිව ඒ ආසන්නයේ මහල් නිවාස සංකීර්ණවල පදිංචි කරවන බව. නමුත් මහල් නිවාසවල පදිංචි කළ පමණින් එවැනි පරිසරයක ජීවත්වීමට එම ජනතාවගේ ආකල්ප වෙනස් වෙන්නේ නැහැ නේද? මහල් නිවාස තුළත් ඔවුන් ජීවත් වන්නේ පැල්පත් සංස්කෘතිය තුළ නම් එහි යහපත් වෙනසක් සිදු වෙවිද?

ජනතාව තුළ පවතින එම ආකල්ප වෙනස් කළ යුතුයි. ජනතාව තුළ නවටු නිවාස පිළිබඳ යම් මට්ටමක සැකයක් පවතින බව ඇත්ත. නමුත් නගරයක් තුළ මහල් නිවාස ක්‍රමය හැර ක්‍රියාත්මක කිරීමට වෙනත් ක්‍රමයක් නැහැ. එය ඕනෑම සමාජ ක්‍රමයක පවතින ගැටළුවක්. නමුත් අපි නගරයක් හැටියට දියුණුවීමට නම් පවතින ක්‍රමය වෙනස් කිරීමට අප මහල් නිවාස ක්‍රමයට යා යුතුයි. නමුත් ඒ පරිවර්තනයේ දී සමාජය එයට හුරුකිරීම සඳහා ආගමික නායකයන් මෙන්ම ඒ ඒ පළාත්වල සමාජ නායකයන්ද එක්ව කටයුතු කළ යුතුයි. මේවා සියල්ල ප්‍රායෝගික ගැටලු මෙන්ම පරිවර්තන යුගයක දී මුහුණදීමට සිදුවන ගැටලුයි. මෙයින් අපට පලා යන්නට බැහැ. නමුත් මේ වන විට මෙය දේශපාලන ගැටලුවක් බවට පත්වී තිබෙන තත්ත්වයක් දකින්නට ලැබෙනවා. මේවැනි

පසුබිමක දී අප ජනතාවට සෘජුව ලබාදිය යුතු පණිවිඩය නම් තමන්ට ඉදිරියට යාමට මෙය මහඟු අවස්ථාවක් වන බැවින් අප අලුතෙන් සිතන්නට පටන්ගත යුතුයි යන්නයි.

ඔබතුමා මැතිවරණයට ඉදිරිපත් වන්නේ සිංහල බෞද්ධ පදනමකින්, නමුත් කොළඹ නගරසභාවට නරඟ කරන විට බොහෝ විට සුළු ජාතිකයෙක් නගර සභා අපේක්ෂකයෙක් ලෙස නම් කිරීම උපායක් ලෙස භාවිත කරනවා. විපක්ෂයෙන් ඉදිරිපත් වී සිටින මුස්ලිම් අපේක්ෂකයා සමඟ නරඟයක් දිය හැකි බවට ඔබ විශ්වාස කරනවද?

මගේ ජීවිත දර්ශනයක් දේශපාලන සංකල්පයක් ගමන් කරන්නේ මැද මාවතකයි. මැද මාවතේ ගමන් කරන නිසා ජනතාව කුමන ආගමික කුමන ජාතියක වුවත් නිවැරදි මාවතකට පැමිණෙයි කියන විශ්වාසය මට තිබෙනවා. මම හැම අනන්‍යතාවකටම ගරුකරනවා. එයට අවබෝධ තිබිය යුතුයි. අපේ බෞද්ධ දර්ශනයේ ඉගැන්වෙන්නේ අනුන් ගැන කතා කිරීම නෙමෙයි. ඒ නිසා අපි දේශපාලනය කරන විට දී පවා බෞද්ධ දේශපාලනයක් කරනවා නම් මේ වන විට මේ රට යහපත් රටක් බවට පත්වී අවසන්. මගේ දර්ශනය එයයි. විවිධ ආගම් විවිධ ජාතීන් අපි ගැන විශ්වාසය තබයි කියන විශ්වාසය මට තිබෙනවා. ඒ අවස්ථාව හිමිවන්නේ ජනතාවටයි. මම කවදාවත් ජාතිවාදී ස්වරූපයකින් ප්‍රශ්නයක් දිහා බලන්නෙ නැහැ. අනිත් අය වෙනස් විදිහට බලනවා නම් එකට මට කරන්න දෙයක් නැහැ. මගේ මතය මම ඉදිරිපත් කර තිබෙනවා. නමුත් වෙනත් ජාතීන් හා ආගම් අතර අපට පවතින විශාල ගැටලුවක් බවට පත්වී තිබෙන්නේ විශ්වාසය දිනාගැනීමයි.

යම් හෙයකින් කොළඹ නගරාධිපති ධුරයට පත් වුවහොත් ඔබ ක්‍රියාත්මක කරන වැඩපිළිවෙල කුමක්ද?

නගරාධිපති ධුරයට තේරී පත් වී පළමු දින 100 තුළ ක්‍රියාත්මක කරන කඩිනම් වැඩපිළිවෙළක් අපි සකස් කර තිබෙනවා. ජනතාව කෙරෙහි විශ්වාසය ගොඩනැඟීමේ පදනමක් සකස් කිරීමයි මෙහි ප්‍රධාන අරමුණ.

අපේ අදහස හැම විටම සමාජය සමඟ කටයුතු කළ යුතුයි යන්නයි. සෑම දෙයක්ම ආණ්ඩුවෙන් ලැබෙන තුරු බලා නොසිට අපි එක්ව කටයුතු කළ යුතුයි. නගර සභාවකට තනි ගමනක් හුදකලා ගමනක් යන්න බැහැ. පවතින රජය සහ පළාත් සභා එකතු විය යුතුය. ඇතැම් අයට ඒ පිළිබඳ හරි අවබෝධයක් නැහැ. නගර සභාවකට අවශ්‍ය ප්‍රතිපාදන හිමිවන්නේ පවතින රජය හරහායි. එය අප අවබෝධ කරගත යුතු දෙයක්. මෙම දින 100 කඩිනම් වැඩපිළිවෙළට අමතරව දිගු කාලීන සැලැස්මක් ද අපි ඉදිරිපත් කර තිබෙනවා.